# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය දෙකයි.**

**නම / අංකය : .......................................................** **8 ශ්‍රේණිය**

**I** කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* **I** කොටසේ එක් ප්‍රශ්නයකට ලකුණු දෙකක් හිමිවේ.

- **හිස්තැන් පුරවන්න.**

(01) (i) ළමයි ................. (ii) තාන්න ...............................

(02) (i) .................. බරි (ii) සරු ...............................

(03) (i) .................. දෙකට (ii) සිතා ...............................

- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳිපද වලට වඩාත් ගැළපෙන යෙදුම යටින් ඉරක් අඳින්න.**

(04) නැඟණියගේ <u>කුකුල් නින්ද</u> නිසා අම්මාට කෑම පිසීමට නොහැකි විය.
(i) තදින් නින්දයෑම. (ii) ස්වල්ප වෙලාවක නින්ද
(iii) හොඳින් නින්ද යෑම (iv) නින්ද නොයෑම.

(05) ඔහු කටයුතු කරන්නේ <u>කැත්තට පොල්ල වගේ</u> යැයි ගුරුතුමිය පවසුවාය.
(i) එකට එක කීම. (ii) කැත්තයි පොල්ලයි වගේ
(iii) සමගියෙන් කටයුතු කිරීම (iv) ගැළපෙන සේ කටයුතු කිරීම.

(06) කමල් සහ නුවන් <u>ජාඩියට මූඩිය වගේ</u> යැයි යහළුවෝ පැවසුහ.
(i) තරහ කාරයන් වගේ. (ii) නොහඳුනන මිතුරන් වීම.
(iii) හොඳට ගැළපෙන බව (iv) නොගැළපෙන බව

(07) <u>ගලේ කෙටුව අකුර වගේ</u> ඔහු මගේ රහස ආරක්ෂා කරන බව පැවසුවේය.
(i) ස්ථිර ලෙසම. (ii) සැමට කියන බව.
(iii) තාවකාලිකව. (iv) කළ නොහැකි බව.

- **මෙම ඡේදයේ ඇතුළත් යුගල පද තෝරා ලියන්න.**

කිරි බණ්ඩා ඉඩම් කඩම් වල ඇති ඇළ දොළ ප්‍රයෝජනයට ගනිමින් කැලෑව කපා කොටා, සුද්ද බුද්ද කර වගා කරමින් අත මිට සරුකර ගත් දිරිය මිනිසෙකි.

(08) .......................................................

(09) .......................................................

(10) .......................................................

(11) .......................................................

(12) .......................................................

(13) .......................................................

- පහත සඳහන් වචන අකාරාදී පිළිවෙළට සකස් කර ඇති නිවැරදි වරණය තෝරන්න.

(14)

I. කෝකිල, කාක්කා, කේතලය, කියත
II. කාක්කා , කේතලය, කෝකිල, කියත
III. කාක්කා, කියත, කේතලය,කෝකිල
IV. කාක්කා, කේතලය, කියත, කෝකිල

(15)

I. ඖෂධ, ඉදල, ඓක්‍ය, ඇත
II. ඖෂධ, ඓක්‍ය, ඇත, ඉදල
III. ඓක්‍ය, ඇත, ඉදල, ඖෂධ
IV. ඇත, ඉදල, ඓක්‍ය, ඖෂධ

- අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(16) ආක්‍යාතය, තීක්ෂණ, අර්දය, රෝපනය
(17) කළමනාකරණය, භාශාව, දියුනු, පරිගනකය
(18) ගෝසාව, බයානක, ප්‍රතිඵල, පැරකුම්බා
(19) සබ්ද විකාසනය, විශේශ, වාර්ශික,ගිජ්ඣකූටය
(20) පුශ්පය, නිශ්පාදනය, රක්ෂණය, දක්ශින

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා වචන දෙසීයට නොඅඩු රචනයක් ලියන්න.

I. **කියවීමෙන් මිනිසා සම්පූර්ණ කරයි.**
II. **මා කියවූ හොඳම පොත.**
III. **මගේ රට මට අගේ.**
IV. **සිංහල අවුරුදු උත්සවයේ අසිරිය.**

(ලකුණු 20)

(02) පෙළපොත ඇසුරින් පිළිතුරු සපයන්න.

I. ඩිංගිරාල බත් කෑවේ මොනවා සමගද?
II. ජන කතා හා ජන කවිය පැවත එන ආකාරය විස්තර කරන්න.
III. සම්ප්‍රදායික යෙදුම් දෙකක් ලියන්න.
IV. රබීන්ද්‍රනාත් තාගෝර් මැතිතුමා ඉවත්වූ පදවිය ලියන්න.
V. රබීන්ද්‍රනාත් තාගෝර් මැතිතුමාජගේ හැත්තෑවන ජන්මෝත්සවය සඳහා සකස් කළ කෘතියේ නම ලියන්න.
VI. "අහසේ තරුවැල් පිරිලා - පොළවේ සුදු මල් පිපිලා" යන පද්‍ය සම්පූර්ණ කරන්න.

VII. රාත්‍රී අහස කවියා සමාන කර දක්වන්නේ කුමකටද?
VIII. "කිරි ගෙඩිය" ලෙස හඳුනා දී ඇත්තේ කුමකටද?
IX. කොකිස්, අච්චාරු යන වචන ලැබුණු ජාතීන් දෙක ලියන්න.
X. "පෙත්සම" කෘතිය රචනා කළ කතුවරයාගේ නම ලියන්න. (ලකුණු 10 x 2 = 20)

(03) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ පන්ති කාමරයේ සකස් කළ බිත්ති පුවත්පතට තැබූ නම ලියන්න.
II. ඒ සඳහා ඔබ ලබා දුන් නිර්මාණය කුමක්ද?
III. බිත්ති පුවත්පත සකස් කිරීමට ගුරුතුමිය ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.
IV. බිත්ති පුවත්පත සකස්කිරීමේදි ඔබට මතු වූ ගැටළු දෙකක් ලියන්න.
V. බිත්ති පුවත්පත සකස් කිරීමේදී ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 10)

(04) කියවන්නෝ - දිනන්නෝ කෘති ඇසුරින් තෝරාගත් ප්‍රශ්න දෙකට පිළිතුරු ලියන්න.

(01) "මොකක්" ඔබ අහසෙන් වැටුණද?
I. ඉහත කියමන කවුරුන් විසින් කාහට කුමන අවස්ථාවේදී පවසන ලද්දක්ද? (ලකුණු 03)
II. ඉහත පාඨයේ ඇතුළත් කෘතිය සහ එම කෘතිය පරිවර්තනය කළ කතුවරයාගේ නම ලියන්න. (ලකුණු 02)

(02) "මොනවද නංගියේ අද දවල් ඇඹුලට හදන්නේ"

I. ඉහත පාඨය කවුරුන් විසින් කාහට කුමන අවස්ථාවේදී අසන ලද්දක්ද? (ලකුණු 03)
II. එම පාඨය ඇතුළත් කෘතිය සහ කතුවරයාගේ නම ලියන්න. (ලකුණු 02)

(03) "අනේ රත්න පැටියෝ උඹට දැරිවියක් ගෙනත් ඒකිට කිරි පුතෙක් ඉන්නවා බලන්න මං හරි ආසයි."

I. ඉහත කියමන කා විසින් කවුරුන් හට කුමන අවස්ථාවේදී කියන ලද්දක්ද? (ලකුණු 03)
II. ඉහත කියමන අයත් කෘතිය හා කතුවරයාගේ නම ලියන්න (ලකුණු 02)